

# සිහින සහ ගරුත්වය :

## මලෛයහ දෙමළ තරුණ තරුණියන් පිළිබඳ කතා

### හැඳින්වීම :

2023 වර්ෂය යටත් විජිත පාලකයින්ගේ වතුවල වැඩ කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි දකුණු ඉන්දීය දෙමළ වැසියන්ගෙන් ඇතැම් කණ්ඩායම් මුලින් ම පැමිණි බවට වාර්තාවන 1823 වර්ෂයේ සිට වසර 200 ක් ගතවීම සනිටුහන් කරයි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසින් ඔවුන්ව කෝපි වතුවල වැඩ කිරීම සඳහා මුලින් ම මෙරටට රැගෙන එන ලද අතර, කෝපි වතු අසාර්ථක වීම ඔවුන්ව අද දක්වාම පැවත එන තේ වතු වල සේවයෙහි යෙදවීමට හේතුව විය. මෙම ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව, ඔවුන්ගෙන් පැවත එන්නන් පරම්පරා හතරක් දක්වා වන පිරිස මෙම දිවයින ඔවුන්ගේ නිවහන ලෙස හඳුන්වා ඇත.

මලෛයහ හෙවත් කඳුරට දෙමළ ප්‍රජාව අඛණ්ඩව ම තේ වතුවල වැඩ කරමින් තේ වතුවල ම ජීවත් වෙති. ඔවුන් රාජ්‍යය විසින් ඡන්ද අයිතිය අහිමි කරනු ලැබීමට සහ වැවිලි කර්මාන්තය විසින් සූරාකනු ලැබීමට ලක්වී ඇත. ඒ සමග ම, ඔවුහු තම ප්‍රජා අනන්‍යතාවය නිර්මාණය කරගනිමින්, ඉහළ වැටුප් සහ ගරුත්වයෙන් යුතු ජීවන තත්ත්වයන් සඳහා අඛණ්ඩව අරගල කරමින් සිටිති.

මලෛයහ දෙමළ ප්‍රජාව සෑම විටම වතුවලින් පිටත, තමන්ට වඩාත්

වාසිදායක යැයි ඔවුන් විශ්වාස කරන විකල්ප රැකියා සොයා ගැනීම සඳහා නගරයට යාමේ අපේක්ෂාවෙන් පසුවූහ. කෙසේ වෙතත්, පසුගිය දශකයක පමණ කාලය පුරා වතු අංශයේ ශ්‍රමිකයින් සංඛ්‍යාවේ විශාල අඩුවීමක් දක්නට ලැබේ. 'ශ්‍රම බලකාය අහිමි වීම' ද වැටුප් වැඩි කිරීමට නොහැකි වීමට එක් හේතුවක් ලෙස වතු හාම්පුතුන් විසින් පෙන්වා දී ඇත.

මෙලෙස වතුකරයේ සිට නගරයට සංක්‍රමණය වීම වැදගත් යථාර්ථයක් පිළිබිඹු කරයි - එනම්, වතු අංශය රැකියා සහ සමාජ සංචලනය සඳහා අවස්ථා තිබෙන ස්ථානයක් නොවේ ය යන්නයි. තමන්ගේ සිහින සහ අපේක්ෂාවන් මෙන්ම අනෙකුත් බොහෝ දෙනෙකුගේ සිහින ද වතුකරය තුළ සැබෑ කර ගත නොහැකි බව මෙම පර්යේෂණයට සහභාගී වූ අය සඳහන් කළහ. ඔවුන්ගේ පෙර පරම්පරාවන් අඩු වැටුපක් ලබා ගැනීම සඳහා තම ශ්‍රමය වැය කරමින් ඉටු කළ යුතු දුෂ්කර කාර්යයන් ඉටු කළ ද, දශක ගණනාවක් තිස්සේ ඔවුන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයෙහි සිදුවී ඇති වෙනස ඉතා අල්ප ය යන්න ඔවුන්ගේ අත්දැකීම වී තිබේ. මෙම තත්ත්වහෙි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ දෙනෙක් නව අනාගතයකට මග සලසන රැකියාවක් හෝ අධ්‍යාපනයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටිති.

මෙම ප්‍රජාවගේ ඓතිහාසික අවස්ථාවක් මෙන් ම ඔවුන්ගේ අනාගතයන් හැඩගස්වා ගැනීමේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් ද වන මෙම අවස්ථාවේ මෙම ප්‍රජාව සිටින තත්ත්වය පිළිබිඹු කිරීමට උපකාර කිරීම නීතිය හා සමාජ භාරය විසින් මෙම ලේඛනගත කිරීම සිදුකිරීමෙහි අපේක්ෂාව වේ.

තරුණ තරුණියන්ගේ අභිලාෂයන් බිහිසුණු මෙන්ම ඉතා ප්‍රබල යන ආකාර දෙකෙන් ම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ගමන් මග වෙනස් කළ අවස්ථා කිහිපයක් ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධකයක් වී ඇත. මෙම ප්‍රජාවගේ වර්තමාන පරම්පරාවේ මුතුන් මිත්තන් මෙරටට පැමිණ සියවස් දෙකක් ගතවී ඇති මෙම අවස්ථාවේ, ඔවුන්ගේ නවතම පරම්පරාව සැදුම්ලත් තරුණ තරුණියන්ගේ හඬ කෙරෙහි මෙම අධ්‍යනයෙහි ප්‍රධාන අවධානය යොමු කරනු ලැබේ. මෙමගින් දිවයින පුරා පිහිටි තේ වගා කරන ප්‍රදේශවල ජීවත් වන මලෛයහ දෙමළ තරුණ තරුණියන්ගේ අත්දැකීම් සහ අභිලාෂයන් එකට එක් කරයි.

මෙම ප්‍රදේශ දිස්ත්‍රික්ක හෝ පළාත් වෙන්වන පරිපාලන මායිම් දැක්වීමට අවශ්‍යයෙන් ම යොදා නොගැනෙන නමුත්, එම එක් එක් ප්‍රදේශයේ හොඳින් ම වැවෙන තේ වර්ග වෙන්කර හඳුනා ගැනීම සඳහා මෙම ප්‍රදේශ වල නම් යොදා ගනු ලැබේ. තරුණ කථිකයින් තමන් මුහුණ දී සිටින අභියෝග විස්තර කරන විට පවා, ඔවුන්ගේ ප්‍රජාව වෙත දිගින් දිගට ම අහිමි කරනු ලැබ ඇති ගරුත්වය සහ අයිතිවාසිකම් සඳහා ප්‍රජාව තුළ ඇති අවශ්‍යතාවය ද ඉතා වැදගත් ලෙස පිළිබිඹු කළහ.

## දිඹුල කලාපය
### මස්කෙළිය - ගවරවිල සහ අප්කොට්

තේ වගා කරන කලාප සිතියමේ භූගෝලීය කේන්ද්‍රස්ථානයේ පිහිටා ඇති මස්කෙළිය ප්‍රදේශය රටේ ඉහළම උන්නතාංශවල පිහිටි තේ වතු කිහිපයකින් සමන්විත වේ.

## මහනුවර කලාපය
### මැදමහනුවර

මහනුවර දෙල්තොට ප්‍රදේශය බ්‍රිතාන්‍ය වැවිලිකරුවෙකු වන ජේම්ස් ටේලර් 1867 වර්ෂයේ දී මෙරට තේ වගා කිරීම ආරම්භ කළ, දිවයිනේ පැරණිතම වාණිජ වතුයාය වන ලූල්කඳුර වතුයාය පිහිටි ප්‍රදේශය වේ.

## සබරගමුව කලාපය
### දැරණියගල - මියනවිට

මෙම ප්‍රදේශ පළාතේ නගර සහ කාර්මික කේන්ද්‍රස්ථාන කිහිපයකට ආසන්නව පිහිටා ඇති බැවින් මෙම ප්‍රදේශවල ජීවත් වන තරුණ තරුණියන්ට දිනපතා වතුවල පිහිටි තම නිවෙස්වලින් පිටත රැකියාවලට ගොස් ආපසු පැමිණීමට හැකි වී තිබේ.

## රුහුණු කලාපය
### දෙණියාය

රටේ අනෙකුත් කලාපවල පිහිටි වතු මෙන් නොව, මෙම කලාපය තුළ පිහිටා ඇති වතු සිංහල බහුතරයක් සිටින නගර වලින් වටවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පංති කාමර තුළ යොවුන් මලෛයහ දෙමළ ප්‍රජාව සහ සිංහල භාෂාව කතා කරන සිසුන් අතර වැඩි සම්බන්ධයක් පවතියි.

## ඌව කලාපය
### බණ්ඩාරවෙල - පූනාගල

දිවයිනේ නායයෑම්වලට ගොදුරු වීමේ වැඩිම අවදානමක් සහිත පළාත තුළ පිහිටා ඇති මෙම කලාපයේ ජීවත්වන ජනතාව අයහපත් කාලගුණ තත්ත්වයන්හි දී තම නිවෙස්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද දැඩි අවදානමකට මුහුණ දෙති.

වතුකර ප්‍රජාව මුහුණ දෙන ඉඩම් හිමිකම් සහ අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් නීතිය හා සමාජ භාරය දීර්ඝ කාලයක් පුරා සම්බන්ධවී කටයුතු කරන, එම වතුවල සහ වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රියාත්මක වන ප්‍රජා පාදක සංවිධානවල සහාය නිසා මෙම පර්යේෂණය සිදු කිරීමට හැකි විය. එම සංවිධාන ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජීවත් වන මලෛයහ දෙමළ ප්‍රජාවට අයත් තරුණ තරුණියන් සම්බන්ධ කර ගැනීම සඳහා එම සංවිධාන උපකාර කළේය.

මෙම ලේඛනගත කිරීම සඳහා නිතිය හා සමාජ භාරය අවුරුදු 16 ත් 21 ත් අතර වයසේ පසුවන, තමන් ගමන් ගනිමින් සිටින මග එකිනෙකාගෙන් වෙනස් වූ තරුණ තරුණියන් සමග කතා කළේය. ඔවුන්ගෙන් සමහරෙක් ඔවුන්ගේ අවසාන පාසල් විභාගවලට පෙනී සිටිමින් සිටියහ; තවත් අය විශ්ව විද්‍යාලයට අයදුම් කරමින් හෝ විශ්වවිද්‍යාල ගමන ආරම්භ කිරීමට සූදානමින් සිටියහ; තවත් සමහරු ඒ වන විටත් වත්තෙන් පිටත රැකියා කරමින් සිටියහ. අපගේ පර්යේෂකයින් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා හරහා ඔවුන්ගේ අධ්‍යාපනය, රැකියා, අනාගත අපේක්ෂාවන් සහ ඔවුන් ජීවත් වන සන්දර්භය තුළ එම අපේක්ෂා සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින බාධක පිළිබඳව ඔවුන් සමග කතා කළහ.

වර්තමානයේ පවතින අධ්‍යාපන සහ රැකියා තත්ත්වයන් පිළිබඳව මෙන්ම ඒ සම්බන්ධයෙන් පවතින අනාගත අපේක්ෂාවන් පිළිබඳව ද ගවේෂණය කිරීම සඳහා මෙම සංවාද වලදී මාතෘකා රාශියක් පිළිබඳව සාකච්ඡා කරන ලදී. එම සාකච්ඡා වලින් මතු වූ ගැටළු බොහෝ ආකාරවලින් එකිනෙකට අනුකූල සහ එකිනෙක හා අන්තර් සම්බන්ධිත විය. එම තරුණ තරුණියන්ගේ ප්‍රතිචාර තුළින් ඉස්මතු වූ ප්‍රධාන තේමාවන් මෙම ලියවිල්ලෙහි වර්ගීකරණය කර ඇත.



# පාසල් අධ්‍යාපනය

මලෙයහ දෙමළ තරුණ තරුණියන්ට ඔවුන්ගේ මුල් අවදියේ සිට ම අධ්‍යාපනය අභියෝග යක් වේ. අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා රාජ්‍ය වියදම් නොමැතිකම වතුකරයේ පාසල්වල වඩාත් ම හොඳින් පෙනෙන්නට තිබේ. මෙම අධ්‍යයනයේ දී අදහස් දැක්වූවන් පෙන්වා දුන් ප්‍රශ්න රාශිය මගින් පහසුකම්, විෂය මාලා සහ මෙම ප්‍රදේශ සඳහා රජය විසින් පත් කරන ලද ගුරු මණ්ඩලය නොමැතිකම වැනි ආකාර වලින් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ දී එම තත්ත්වය බලපාන ආකාරය කෙරෙහි අවධානය යොමු කරයි. ඔවුන්ගේ අනාගතයන් හැඩගැස්වීමේදී ද එය ඉතාමත් වැදගත් වේ.

අදහස් දැක්වූවන් ප්‍රවාහනයේ සිට පාසල්වල ඇති පහසුකම් දක්වා වූ විවිධ ගැටළු පෙන්වා දුන්හ. අනාගත අභිලාෂයක් හඹා යෑම සඳහා අඛණ්ඩව අධ්‍යාපනයෙහි නිරතව සිටින්නේ කෙතරම් සුළු පිරිසක්ද යන්න ඔවුහු පෙන්වා දුන්හ. මෙයට දශකයකට පෙර විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් මේ වන විට විශ්ව විද්‍යාලයට ඇතුළත් වන අතර ම, වැඩි පිරිසක් ආදායමක් උපයා ගැනීම සඳහා රැකියාවක් කිරීම තෝරා ගන්නා බව ද ඔවුන්ගේ අදහස විය.

ප්‍රවාහන ගැටළු පාසල් වෙත ප්‍රවේශවීම කෙරෙහි බලපාන දැඩි සහ අඛණ්ඩව පවතින බාධකයක් වී තිබේ. පාසල් යාම සඳහා දැරීමට සිදු වන වියදම ආරම්භ වන්නේ ඔවුන් ඔවුන්ගේ නිවස ලෙස හඳුන්වන, වතුවල පිහිටි ලයින් කාමර සහ ඔවුන්ට ආසන්න ම පාසල අතර ඇති අති විශාල දුර ප්‍රමාණයත් සමගිනි. විභාග පැවැත්වෙන කාලවල දී මෙම දුර විශේෂ අභියෝගයක් විය හැක.

ඔවුන් වයසින් වැඩෙත්ම, වතු පාසල්වල බොහෝ විට උසස් පෙළ දක්වා පන්ති නොපැවැත්වෙන බැවින් ඇතමුන්ට නගරවල පිහිටි පාසල්වලට යාමට සිදු වෙයි. මෙයින් අදහස් වන්නේ දෙමව්පියන්ට දරුවන්ගේ බස් හෝ ත්‍රිරෝද රථ ගාස්තු පියවා ගැනීම සඳහා අමතර වියදමක් දැරීමට සිදුවන බව ය.

බස් කොන්දොස්තරවරුන් වතුවලින් පැමිණෙන සිසුන් රැගෙන යාමට ඇති ඉඩකඩ අඩු බැවින් බස් රථයෙන් ගමන් කිරීමට උත්සාහ කිරීම එතරම් විශ්වාස තැබිය නොහැකි ක්‍රමයක් විය හැක. ඔවුන්ගේ වාර ප්‍රවේශපත්‍ර වලින් අනෙකුත් මගීන්ගේ ප්‍රවේශපත්‍රවලින් තරම් ලාභ නොලැබීම එයට හේතුව වේ.

“

**වතු ලයින් කාමරවලට ළඟින් ම පිහිටි බස් නැවතුමට යන්න එක පැත්තකට විනාඩි තිහක විතර කාලයක් පයින් යන්න වෙනවා. පාරවල් කැඩිලා, ත්‍රීවීල් එකකටවත් යන්න බෑ. ඒ නිසා පයින් යනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් නෑ.**

- පූනාගල -

මහනුවරට ඔබ්බෙන් පිහිටි මැදමහනුවර ප්‍රදේශයේ සිසුන් ප්‍රධාන මාර්ගයට ළඟාවීම සඳහා කිලෝමීටර් 3 ක දුරක් පයින් ගමන් කර ඉන්පසු බස් රථයකින් පාසලට යා යුතුය. ඇතැම් විට තම නිවෙස්වල සිට ප්‍රධාන මාර්ගයට ගමන් කිරිමට ත්‍රිරෝද රථයක් ලබා ගැනීමට ඔවුන්ට හැකි වන නමුත් ඒ සඳහා අයකරන ගාස්තුව, විශේෂයෙන් ම වර්ෂාව ඇති අවස්ථාවල, වැඩි විය හැක. පාසැලේ ක්‍රමානුකූල ආකාරයකට ඉගැන්වීමක් සිදු නොවන බැවින් හෝ පෞද්ගලික උපකාරක පංති වලට සහභාගී වීමට ඇති සමාජ අපේක්ෂාව නිසා ඇතැම් සිසුන් පෞද්ගලික පන්ති වලට සහභාගීවීම සඳහා දිගන (කි.මී. 21) හෝ මහනුවර (කි.මී. 38) දක්වා දුරක් ගමන් කරති. එපමණක් නොව, ඔවුන් උපකාරක පන්ති සහ අනෙකුත් ගාස්තු සඳහා විශාල මුදලක් ද වැය කරන අතර, ඇතැම් දෙමව්පියන් ඒ සඳහා ඔවුන්ගේ වැටුප මදි වූ විට එම වියදම් පියවා ගැනීම සඳහා ණය ලබාගෙන ණයගැති භාවයට පත් වී ඇත.

මෙම ප්‍රදේශයෙන් අධ්‍යයනයට සහභාගීවූවන් අන්තර්ජාල සම්බන්ධතා නොමැතිකම ද ගැටළුවක් ලෙස සඳහන් කර ඇත. ඔවුන්ගේ දුරකථන සඳහා වඩාත්ම පැහැදිලිව සංඥා ලබා ගත හැක්කේ කඳු මුදුනේ ඇති පයින් වනාන්තරයට ගමන් කළ හොත් පමණි. මෙහි බිම කුඩැල්ලන් ගහන වන අතර වල් ඌරන් ද ප්‍රදේශයේ නිතර ගැවසෙන බව ඔවුහු පැවසූහ. එම නිසා සවස 5 න් පසුව යම් පංතියක් පැවැත්වීමට නියමිත වුව හොත් සිසුන්ට එම පන්ති මගහැරීමට සිදු වේ.

තමන් දක්ෂතාවය දක්වන හෝ ඉගෙනීමට කැමති ඇතැම් විෂයයන් දෙමළ මාධ්‍ය පාසල්වල උගන්වන්නේ නැති බැවින් විෂයයන් සඳහා ප්‍රවේශය සීමිත වීම ද ගැටළුවක් බව සහභාගිවන්නන් පෙන්වා දුන් අතර, මෙම තත්ත්වය නිසා තමන් අකමැති හෝ තමන් දක්ෂතාවයක් නොදක්වන විෂයයන් ඉගෙන ගැනීමට ඔවුන්ට සිදු වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ දෙනෙකුට උසස් පෙළ

විෂයයන් හැදෑරීම සඳහා එම විෂයයන් උගන්වනු ලබන්නේද සහ ගුරුවරුන් සිටින්නේද යන කරුණු සැලකිල්ලට ගෙන 'වඩා ලොකු පාසලකට', එනම් නගරය ආසන්නයේ පාසලකට ඇතුළත් වීමට සිදුවේ. විෂයයන් සඳහා ඇති ප්‍රවේශය සීමිත වීම ඔවුන්ට රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුල් වීමට ඇති අවස්ථාව තවදුරටත් අවහිර කරන අතර, ඔවුන්ගේ රැකියා විකල්පයන් ද වඩාත් පටු කරයි.

ප්‍රදේශයේ දෙමළ මාධ්‍ය පාසල්වල ඉගැන්වීම සඳහා ගුරුවරුන් නොමැතිකම ද වතුකරය ආශ්‍රිත පාසල් තුළ වර්ධනය වෙමින් පවතින ගැටලුවක් වී තිබේ. බොහෝ පන්තිවල ගුරුවරුන් නොමැති විට තමන්ගේ දෙමව්පියන් තමන් පාසල් යැවීම සඳහා දරන වියදම නාස්තියක් ලෙස සිසුන් දකින බැවින් එය පාසල් අධ්‍යාපනය හැර යාමට වක්‍රාකාරයකින් සිසුන්ව පොළඹවයි.

**ප්‍රදේශයේ සිංහල මාධ්‍ය පාසල්වලට සාපේක්ෂව දෙමළ මාධ්‍ය පාසල්වල ක්‍රීඩා පිට්ටනි සහ විෂය බාහිර ක්‍රියාකාරකම් වැනි පහසුකම් අඩු ය. ඇතැම්විට පන්ති කාමර ඉඩකඩ වැනි මූලික අවශ්‍යතා පවා නෙමැත.**

- මැදමහනුවර -

උදාහරණයක් ලෙස, මෙම වත්තේ සිසුන් අධ්‍යාපනය ලබන මැදමහනුවර පාසලේ 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා වන සියලු පන්ති පවත්වනු ලබන්නේ එකම ගොඩනැගිල්ලක් තුළ ය. අයහපත් කාලගුණය හේතුවෙන් ඔවුන්ගේ පාසලට හානි සිදු වූ විට, ඔවුන් තාවකාලිකව ප්‍රදේශයේ සිංහල මාධ්‍ය පාසලක ගොඩනැගිල්ලක් තුළ ස්ථානගත කරනු ලැබුවේය. මාසයකට පසුව ඔවුන් නැවතත් ඔවුන්ගේ පාසලට පැමිණි විට එය තවමත් අලුත්වැඩියා කර නොමැති බව ඔවුන්ට පෙනී ගියේය.

බණ්ඩාරවෙල ප්‍රදේශයේ දී, ඇතැම් සිසුන්ට ඔවුන්ගේ උසස් පෙළ ප්‍රතිඵල ලැබී තිබුණු අතර ඔවුන්ට එම තත්ත්වයට පැමිණීමට පවා කෙතරම් අපහසු වූයේද යන්න පිළිබඳව ඔවුහු කතා කළහ. ඔවුන්ට වඩාත්ම ආසන්න පාසලේ උසස් පෙළ වාණිජ




සහ කලා විෂය ධාරාවන් පමණක් උගන්වනු ලබන අතර, එය සිසුන්ගේ උසස් අධ්‍යාපන තේරීම දැඩි ලෙස සීමා කර ඇත. විද්‍යා හෝ ගණිත විෂයයන් හැදෑරීමට කැමති සිසුන්ට ඒ සඳහා කි.මී. 17 ක දුරක් ගමන් කරමින් බණ්ඩාරවෙල නගරයට යාමට සිදු වේ.

තම ප්‍රදේශයේ පිහිටි පාසලේ සාමාන්‍ය පෙළ පන්තියේ සිසුන් 85 ක් තරම් සංඛ්‍යාවක් සිටිය ද උසස් පෙළ පන්තියේ සිටියේ සිසුන් 21 දෙනෙක් පමණක් බව මෙම සිසුහු සඳහන් කළහ. මෙම සංඛ්‍යාව අඩුවීමට හේතු වී ඇත්තේ වෙනත් විෂයයන් හැදෑරීම සඳහා සිසුන් නගරයට යාම සහ සිසුන් පාසලෙන් ගිලිහීම වැනි කරුණු කිහිපයක එකතුවක් වේ.

ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ප්‍රවේශය සීමිත වීම ද මලෛයහ දෙමළ සිසුන් නිබඳව ප්‍රකාශ කළ ගැටලුවක් විය. ක්‍රීඩා සඳහා පාසලේ ඇති පහසුකම් සීමා සහිත වීම හෝ කිසිදු පහසුකමක් නොතිබීම නිසා ක්‍රීඩා හැදෑරීමට සහ ක්‍රීඩා කිරීමට කැමති සිසුන්ට එම අවස්ථාව අහිමි වී තිබේ. විධිමත් ක්‍රීඩා කණ්ඩායම් ඇත්තේ කුඩා පාසල් වලින් ඉතාමත් අල්පයක වන බැවින් සිසුන්ට ක්‍රීඩා තරගවලට සහ තරගාවලීන්ට සහභාගී වීමට අවස්ථාව ලැබෙන්නේ අල්ප වශයෙනි.

**මම කැමතියි ඉහළ මට්ටමකට, ඒ කියන්නේ ක්‍රීඩා කණ්ඩායමකට ක්‍රීඩා කරලා ක්‍රීඩා පුහුණුකරුවෙක් වෙන්න. ඒත් එහෙම කරන්න නම් මට ගෙදරින් ඈත තියෙන ලොකු ඉස්කෝලවලට යන්න, එහෙම නැත්නම් ක්‍රීඩා සමාජවලට බැඳෙන්න වෙනවා. මට හැකි උපරිම මහන්සියෙන් උත්සාහ කිරීමට මම අධිෂ්ඨාන කරගෙන හිටියත්, මට මේ මාර්ගය අනුගමනය කරන්න සරල ක්‍රමයක් නැහැ.**

- දෙනියාය -

ඔවුන් තමන් විසින් ම නිල ඇඳුම් සහ උපකරණ ආදිය සඳහා වන වියදම් ද ආවරණය කර ගත යුතු යි. මේ සඳහා සම්බන්ධ වීමට පාසල් වලට නොහැකි බැවින් ඒ පුද්ගලයින් විසින් ම සියල්ල ඉටුකර ගත යුතුයි. බොහෝ සිසුන්ට තම නිවසේ ඇති වගකීම් ද සමග ඔවුන්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම්වල ද නිරතවීම දුෂ්කර ය.

බණ්ඩාරවෙල ප්‍රදේශයේ දී අධ්‍යයනයට සහභාගීවූවන් ක්‍රිකට් ක්‍රීඩා කිරීමට කැමති සිසුන් සිටියත් ඔවුන්ට ඒ සඳහා අවස්ථාවක් නොමැති බව ප්‍රකාශ කළහ. ඔවුන්ට අත්විඳීමට සිදුවී ඇති පහසුකම් ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතුව ඔවුන් මලෙයහ දෙමළ ප්‍රජාවේ අය නිසා ය යන්න ඔවුන්ගේ හැඟීමයි.

මහනුවර දී, ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ තරුණ කණ්ඩායම් වතුවල දරුවන් සමග අවංකභාවයෙන් යුතුව හෝ තිරසාර ආකාරයකට සම්බන්ධ නොවන බව ප්‍රතිචාර දැක්වූවන් සඳහන කළහ. ඔවුන් ඇතැම් අවස්ථාවල යම් යම් ක්‍රියාකාරකම්වලට ඔවුන්ව සම්බන්ධ කර ගන්නා නමුත් මෙම ප්‍රජාව කෙරෙහි ඔවුන් දක්වන අවධානය අල්ප ය, නැත හොත් අවධානය යොමු නොකරයි.

# විශ්ව විද්‍යාලය

අධ්‍යයනයට සහභාගීවූවන් කිහිප දෙනෙකු සෞන්දර්ය කලා විෂයයන්හි සිට ව්‍යාපාර අධ්‍යයනය දක්වා වන විෂය පරාසයකට අයත් විෂයයන් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල වලට ඇතුළත් කර ගෙන ඇති බැවින් ඔවුන් උසස් අධ්‍යාපනය හැදෑරීම තෝරාගෙන ඇත. ඔවුන්ගේ පරම්පරාවේ අන් අයට වඩා වැඩි ආදායමක් උපයා ගත හැකි වන රැකියා ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමට ඔවුන්ගේ දෙමව්පියන්ට අවශ්‍යව ඇති බව ඔවුහු සඳහන් කළහ.

පැවැත්ම සඳහා ප්‍රමාණවත් වන නමුත් ඔවුන්ට එයින් කිසිදු ඉතිරි කිරීමක් සිදු කිරීමට ඉඩ නොලැබේ. විශ්වවිද්‍යාලයට ඇතුල්වන තරුණ තරුණියන් අවුරුදු හතරක කාලයක් ගතවන එම අධ්‍යාපනය ලබා ගැනීම සඳහා තමන්ට දැරීමට සිදු වන අමතර වියදම් පිළිබඳව සඳහන් කළ අතර, මෙය නිවැරදි තේරීම දැයි ඔවුහු ප්‍රශ්න කළහ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන මලෙයහ තරුණ තරුණියන්ට දෙමළ භාෂා මාධ්‍යයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීම සැලකිය යුතු ගැටළුවක් විය.



විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීම පිළිබඳව සොයා බලමින් සිටි අය හෝ ඒ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබා ඇති අය තමන් කැමති පාඨමාලා වෙනත් විශ්වවිද්‍යාලවල දෙමළ මාධ්‍යයෙන් නොපැවැත්වෙන නිසා තමන් නැගෙනහිර පළාතේ හෝ යාපනයේ පිහිටි ඇතැම් විශ්වවිද්‍යාල තෝරාගෙන ඇති බව දැරණියගලදී අදහස් දැක්වූවන් සඳහන් කළහ.

ඔවුන්ගේ දෙමව්පියන් සහ තේ වතුවල සේවය කරන අනෙකුත් සේවකයින් උපයන මුදල බොහෝ විට ඔවුන්ගේ පවුල් වලට එදිනෙදා

මස්කෙලිය ප්‍රදේශයේ දී අප සමග කථා කළ අය, තම දිස්ත්‍රික්කයේ සහ අනෙකුත් වතුවල පවතින තත්ත්වය උතුරු නැගෙනහිර දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රදේශවල පවතින

තත්ත්වය සමග සංසන්දනය කළහ. මලෙයහ දෙමළ සිසුන් සංඛ්‍යාවට සාපේක්ෂව සැලකිය යුතු තරම් වැඩි සිසුන් සංඛ්‍යාවක් එම ප්‍රදේශවලින් විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙති.

සිසුන් පාසල් අධ්‍යාපනය නිමකර අවසාන විභාගවලට පෙනී සිටින විට ඔවුන්ට මග පෙන්වීමක් නොලැබීම එක් ප්‍රධාන ගැටළුවක් විය; ඔවුන් ගමන් කළ යුතු මාර්ග පිළිබඳව සහ ඔවුන්ට තෝරා ගැනීමට ඇති විකල්ප පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබා දිය හැකි ගුරුවරුන් හෝ උපදේශකයින් නොසිටිති. උදාහරණයක් ලෙස, ප්‍රාදේශීය වශයෙන් සුදුසුකම් පිරිනමන අධිකාරීන් විසින් සිසුන් සඳහා නොමිලයේ පවත්වනු ලබන පාඨමාලා කිහිපයක් ඇතත් ඒවා පිළිබඳව සිසුන් අතර ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැත.

> විශ්වවිද්‍යාලය නිවසින් දුර බැහැර පිහිටා ඇති නිසා අපගේ දෙමව්පියන් ඇතැම්විට අපව විශ්වවිද්‍යාලයට යැවීමට බිය වෙති. මධ්‍යම කඳුකරයේ වතු පිහිටි ප්‍රදේශ ආසන්නයේ පූර්ණ පහසුකම් සහිත රජයේ විශ්වවිද්‍යාල තිබීම ප්‍රයෝජනවත් වනු ඇත.
>
> - මස්කෙළිය -

විශ්වවිද්‍යාලට ඇතුල්වී අධ්‍යාපන කටයුතු සිදුකරගෙන යාම සඳහා විශ්වවිද්‍යාලය අධ්‍යාපනයට පොළඹවන විවිධ උත්ප්‍රේරක ගණනාවක් පිළිබඳව මලෙයහ දෙමළ තරුණ තරුණියන් ප්‍රකාශ කළහ.

විශ්ව විද්‍යාල උපාධියක් ලබා ගැනීමට හෝ උසස් අධ්‍යාපන සුදුසුකමක් ලබා ගැනීමට තෝරා ගත් අය හොඳ රැකියාවක් ලබා ගැනීමට නම් තම පාඨමාලාවල විභාග සමත් විය යුතු බව දැරණියගල ප්‍රදේශයේ දී අදහස් දැක්වූවන් පවසති. එසේ නොවුව හොත්, 'මෙතරම් ඉගෙන ගත්තේ මන්ද' යනුවෙන් තමන්ගේ ගමේ මිනිසුන් සිතනු ඇති බව - එනම් අධ්‍යාපනය සඳහම් මෙතරම් මුදලක් වැය කළත් හොඳින් ඉගෙනගෙන නැතැයි ගම්මුන් සිතනු ඇති බව ඔවුහු පවසති.

> **"මම විභාගවලට පෙනී සිටින්නේ මන්දැයි මගේ නෑදෑයන් නිතරම ප්‍රශ්න කරනවා - මට දැන් හිතෙන්නේ මම හොඳට පාඩම් කරලා විභාග පාස්වෙන්න ඕනෑ කියලා, එහෙම නොවුණොත් ඔවුන් කියාවි මම අධ්‍යාපනය සඳහා කාලය සහ මගේ පවුලේ මුදල් නාස්ති කළා කියලා.**
>
> - ගලහ -

මෙම මාර්ගයේ ගමන් කිරීම මගින් තමන්ට ඇති කළ හැකි බලපෑම පිළිබඳව මස්කෙළිය ප්‍රදේශයේ තරුණ තරුණියන් දැනුවත්ව සිටිති. ඔවුන් අධ්‍යාපනය තෝරා ගන්නේ නම්, අනෙක් මිනිසුන් එය අනුගමනය කිරීමට දිරිගැන්වීමක් ලෙස සලකමින් තව තවත් අය ඉගෙනීමට යොමු කරනු ඇති බව ඔවුහු සිතති.

තමන් අධ්‍යාපනය ලැබීමට තීරණය කළ විට "ගැහැණු ළමයින්ට ඉගෙනගන්න ඕනෑ නැහැ" යනුවෙන් තමන්ට පැවසූ බව දැරණියගල ප්‍රදේශයේ සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ තරුණියන් ගෙන් ඇතමෙක් පැවසූහ. ඔවුන්ට විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට ලැබීම එයට ප්‍රතිරෝධය දැක්වීම සඳහා අවස්ථාවක් වූ අතර, ඒකාකෘති වැරදි බව ඔප්පු කිරීමට ද අවස්ථාවක් විය.

මස්කෙළිය ප්‍රදේශයේ බොහෝ දෙනෙක් ඔවුන් කුඩා කල සිටම උනන්දුවක් දැක්වූ වෘත්තියක් වන වෛද්‍යවරයකු වීම සඳහා විශ්වවිද්‍යාලයට ගොස් අධ්‍යාපනය ලැබීමට සැලසුම් කර තිබුණි.

බොහෝ තරුණ තරුණියන් අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය කිරීමේදී අධ්‍යාපනය කෙරෙහි ඔවුන්ගේ දෙමව්පියන් තුළ ඇති ආකල්ප වැදගත් වේ.

'තමන් මෙන් දුක් විඳින්නේ නැතිව' හොඳ, ගරුත්වය සහිත රැකියාවක්



සොයා ගත යුතු බව වතුවල වැඩ කළ බොහෝ දෙමව්පියන් ඔවුන්ට පවසා ඇත. රැකියාවක් කිරීම සඳහා පාසලෙන් ඉවත් වීමේ අදහස හොඳ යැයි සිතූ සිසු සිසුවියන් තම දෙමව්පියන් තමන් එසේ කිරීම අධෛර්යමත් කළ බව පැවසූහ.

යම් අධ්‍යාපනයක් ලබා ඇති දෙමව්පියන් ද අධ්‍යාපනයට යම් නිරාවරණයක් ලබා ඇති බැවින් තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට ඔවුන්ට අවශ්‍යවී ඇති බව අදහස් දැක්වූවන් සඳහන් කළහ. සුළු අධ්‍යාපනයක් ලබා තිබූ, නැතහොත් අධ්‍යාපනය ලබා නොතිබූ දෙමව්පියන් ද තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම කෙරෙහි ඒ හා සමාන උද්‍යෝගයක් දැක්වූහ. මෙම කණ්ඩායම් දෙකට අයත් අය ඔවුන්ගේ මුළු ජීවිත කාලය පුරාම වතුවල වැඩ කර ඇති අතර - ඇතැම් අවස්ථාවලදී, ඔවුන් එසේ වැඩ කළ අවසාන පරම්පරාව විය - සූරාකෑමට ලක්වීමේ ක්‍රමවේදයකින් මිදී තම දරුවන්ට එයින් පිටතට යා හැකි ගමන් මාර්ගය අධ්‍යාපනය ලැබීම යැයි සැලකූහ.

තම පියා දරුවන් තිදෙනෙකුට අධ්‍යාපනය ලබාදීම සඳහා රැකියා දෙකක් කරන බව බණ්ඩාරවෙල ප්‍රදේශයේ දී අදහස් දැක්වූ එක් සහභාගීවූවෙක් පැවසුවේ ය. තම අධ්‍යාපනය දිගට ම කරගෙන යා යුතු බවත්, එවිට ඔහුට විදේශ රැකියාවක් ලබා ගැනීමට සහ එමගින් මුළු පවුල ම රැකබලා ගැනීමට මාර්ග යක් සොයා ගත හැකි බවත් එම පියා ඔහුගේ පුත්‍රයාට පවසා ඇත.

"

**වතු කළමනාකාරීත්වය තමන්ට 'වහලුන්ට මෙන්' සලකන බව අපගේ දෙමව්පියන් අපට කියා තිබෙනවා, එබැවින් අපි වඩා හොඳ රැකියාවක් කරන එක තමයි ඔවුන්ට අවශ්‍ය වෙලා තියෙන්නෙ. ඉගෙනීම අපට සමාජය තුළ 'හොඳ නමක්' ලබා ගැනීමට උපකාරී වනු ඇති අතර, අපට යම් ගරුත්වයක් ද ලබා දෙනු ඇත. කිසිවෙකුත් පරම්පරා ගණනාවක් වතුවල කම්කරුවන් ලෙස වැඩ කර ඇති මෙම ප්‍රජාවේ සාමාජිකයින්ව ගණන් නොගන්නා බව ඔවුන්ට හැඟෙයි.**

- මස්කෙළිය -



# රැකියා

මෙම සියලු කලාප පුරා බොහෝ තරුණ තරුණියන්, ඇතැම් විට ඔවුන්ගේ අධ්‍යාපනය පවා අතහැර දමා, දැනටමත් වතු වලින් පිටත රැකියාවල නිරතවී හෝ නිරත වීමට සූදානම් වෙමින් සිටින බව අපගේ අවධානයට යොමු විය. අපගේ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගී වූ කිසිවෙකුට වතු ප්‍රදේශ තුළ දිගින් දිගටම රැකියා කිරීමට කිසිදු කැමැත්තක් හෝ සැලැස්මක් නොතිබුණි. ඔවුන්ගේ දෙමව්පියන් වතුවල දුෂ්කරතා මධ්‍යයේ කම්කරු රැකියා කළ ද, ඉන් අඩු ආදායමක් ලැබීම සහ සමාජ සංචලනයක් සිදු නොවීම නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වයෙහි වැඩි දියුණුවක් සිදු නොවන බව දැකීමෙන් ඔවුන් ඔවුන්ගේ දෙමව්පියන්ගේ අත්දැකීම් තුළින් බොහෝ දුරට දැනුවත් වීම එයට හේතුව වේ.

දැනට රැකියාවේ නියුක්තවී සිටින තරුණ තරුණියන් තම පවුල් නඩත්තු කිරීමට උපකාර වන කෙටි කාලීන රැකියා වල සේවය කරයි, නැත හොත් කිරීමට අපේක්ෂා කරයි. දීර්ඝ කාලීන වශයෙන් ඔවුන් සේවා නියුක්තයින්ගේ භාර අරමුදල, සේවක අර්ථසාධක අරමුදල සහ එවැනි වෙනත් ආරක්ෂණයන් සපයා දෙන, යම් කාලයක් පුරා රැඳී සිටිය හැකි රැකියාවක් ලබා ගැනීමට ඔවුන් බලාපොරොත්තු වේ.

ඇඟළුම් කම්හල්වල රැකියා මලෛයහ දෙමළ තරුණ තරුණියන්ට වැදගත රැකියා මූලාශ්‍රයක් විය. ඇඟලුම් කම්හල් සේවකයින් බඳවා ගැනීම සඳහා ක්‍රියාකාරීව ප්‍රදේශයේ වතු සහ කුඩා ගම්මානවලට පැමිණෙයි. වතුවලින් පිටත හොඳ වැටුප් සහිත රැකියාවක් සොයා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින තරුණ තරුණියන්ට මෙම අවස්ථාව තමන් අනෙකුත් කම්කරුවන් හා සමාන තත්ත්වයක සිටින රැකියා කිහිපය අතරින් එකක් වේ. නමුත් ඇඟළුම් කම්හල්වල තිබෙන සේවා කොන්දේසි දුෂ්කර ය.

දැරණියගල ප්‍රදේශයේ දී අදහස් දැක්වූවන් අතරින් කිහිප දෙනෙක් මෙයට පෙර අවිස්සාවේල්ල ප්‍රදේශයේ සහ, විශේෂයෙන් ම, සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇඟලුම් කම්හල්වල සේවය කර ඇත. පසුගිය වසර දෙක තුළ කොවිඩ් වසංගතය පැවති කාලයේ දී, කර්මාන්තශාලා තුළ කොවිඩ් රෝගය සම්ප්‍රේෂණය වීමේ ඉහළ අවදානමක් තිබීම හේතුවෙන් ඔවුන්ට එම රැකියාවලින් ඉවත් වීමට සිදු විය.

මහනුවර ප්‍රදේශයේ ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, මැදමහනුවර වතුයායේ තරුණ තිරුණියන් ගණනාවක් පාසල් අධ්‍යාපනය නිමවී ඇඟළුම් කම්හල්වල රැකියාවට යති. ප්‍රදේශය අවට දුරකථන කණුවල මෙම කර්මාන්තශාලා සහ ඒවායෙහි බඳවාගන්නන් විසින් සේවකයින් බඳවා ගැනීම සඳහා වන පෝස්ටර් ප්‍රදර්ශනය කර ඇති අයුරු දැකගත හැකිය.



බොහෝ දෙනෙක් මහනුවර කර්මාන්ත කලාපයේ ද (කිලෝමීටර් 25 ක් දුරින් පිහිටි පල්ලෙකැලේ), තෙල්දෙණියේ (කිලෝමීටර් 13 ක් දුරින්) පිහිටි තවත් කර්මාන්තශාලා කිහිපයක ද රැකියා සොයා ගනිති. එම කර්මාන්තශාලා රු. 18,000 ක මූලික වැටුපක් හෝ අතිකාල සමග මසකට උපරිම රු. 35,000 ක වැටපක් පිරිනමයි. මෙම කම්හල්වල පාසලෙන් ගිලිහුණු තරුණ තරුණියන් පමණක් නොව, අඛණ්ඩව අධ්‍යාපන කටයුතු කරමින් සිට දැන් මෙම රැකියාව තෝරාගෙන ඇති අය ද සේවය කරති.

මෙම අවම මූලික වැටුප ලබා ගැනීම සඳහා උදෑසන 7.30 ට වැඩ ආරම්භ කර සවස 6.30 දක්වා වැඩ කළ යුතු වේ. එක් වැඩ කරන දිනයක් හෝ සේවයට නොපැමිණිය හොත් මාසික පැමිණීමේ ප්‍රතිලාභය අහිමි වෙයි. සේවකයෙක් අසනීප වුව හොත් හෝ හදිසියේ එදින රැකියාවට යාමට නොහැකි වුව හොත් කළමනාකාරිත්වයට දැනුම් දිය යුතු වේ. මාස හතරකට ආසන්න කාලයක් රැකියාව කිරීමෙන් පසු ඇයට එක් දිනයක් පමණක් නිවාඩු ලැබුණු බව තරුණ සේවිකාවක් පැවසුවාය.

“

**මෙම නිෂ්පාදන අංශවල රැකියා වලින් වතුවල වැටුපට වඩා හොඳ වැටුපක් ගෙවනවා, නමුත් තවමත් ඒවායෙහි ලැබෙන්නෙ අඩු ගරුත්වයක් - ඉතාම සුළු වැරැද්දකට පවා කම්කරුවන්ට බැනවදින බව අපි අහල තියෙනවා.**

- මස්කෙළිය -

දෛනික කුලී වැඩ ද පුළුල්ව පැතිර ඇති රැකියා මූලාශ්‍රයකි. දෛනික පදනම මත වැටුප ගෙවනු ලබන මිනිස්බල රැකියා මෙයට ඇතුළත් වේ. කෙසේ වෙතත්, මෙම රැකියාවල ද සේවකයෙකුට ගෙවනු ලබන මූලික වැටුප ඉතා අඩු වන අතර, ප්‍රමාණවත් මුදලක් ලබා ගැනීමට නම් ඔවුන් අතිකාල පැය කිහිපයක් සේවය කළ යුතු වේ.

දැරණියගල ප්‍රදේශයේ මෙම පිරිස දැනට වත්තේ සිට පිළිවෙළින් කිලෝමීටර් 8 ක් සහ 28 ක් පමණ දුරින් වූ දැරණියගල සහ අවිස්සාවේල්ල යන ප්‍රධාන නගරවල දෛනික කුලී වැඩවල නිරත වෙති. ඔවුන් ප්‍රදේශයේ කොන්ත්‍රාත්කරුවන් යටතේ ව්‍යාපෘති පදනමෙන් ඉදිකිරීම්, වඩු වැඩ සහ පින්තාරු කිරීමේ කාර්යයන් සිදු කළහ.

බොහෝ මලෛයහ දෙමළ තරුණ තරුණියන් කොළඹ ප්‍රදේශයේ රැකියා සොයා යති. පාසල් අධ්‍යාපනය නිමවීමට පෙර පාසලෙන් ගිලිහෙන හෝ සාමාන්‍ය පෙළ විභාගය සමත් නොවන තරුණ තරුණියන් බොහෝවිට පිටකොටුව කර්මාන්ත හා වාණිජ ප්‍රදේශය ආශ්‍රිතව විවිධ කඩ සාප්පුවල සේවය කිරීමට කොළඹට යති. බොහෝ පවුල්වලට ආර්ථික පැවැත්ම ඉහළම ප්‍රමුඛතාවය වන අතර, මෙම තත්වයන් තුළ අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාමට තෝරා ගැනීම දුෂ්කර කාර්යයක් විය හැක.

මහනුවර දී, සමහර සිසුන් රැකියාවක් සොයා කොළඹට ගිය අවුරුදු 13 සහ 14 තරම් අඩු වයස්වල මිතුරන්ව දැන සිටියහ.

නව යොවුන් වියේ දී රැකියා කිරීමට තෝරා ගන්නා අයට එසේ රැකියාවක් කිරීමට සිදු වන හේතු විවිධාකාර වේ. ආර්ථික අරගලය හේතුවෙන් ඇතිවන පවුල් ප්‍රශ්න මෙම සිසුන් අධ්‍යාපනය නිම කිරීමට පෙර පාසල හැර යාමට තීරණය කිරීමට බලපාන ප්‍රධාන හේතුවයි. බොහෝ අවස්ථාවල, විශේෂයෙන් ම පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් දෙමව්පියන්ට තම දරුවන් පාසල් යැවීම සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවේ. එමනිසා, මෙම දරුවන් බොහෝ දෙනෙක් යොවුන් වියේදී ම රැකියා කිරීම ආරම්භ කරති.

ඇතැම් අය පාසලේදී අධ්‍යාපන කටයුතුවලට දක්ෂතා නොදක්වන නිසා ඔවුන්ට යොවුන් වියේදී ම පාසලෙන් ඉවත් වී රැකියාවක් සොයා ගැනීමට සිදු වේ. අදහස් දැක්වූ ඇතමුන් තමන්ගේ අධ්‍යාපන කටයුතු ප්‍රමාද කර, නැත හෙත් අත්හැර දමා, තමන්ට ලැබෙන වැටුපෙන් තම බාල සහෝදර සහෝදරියන්ගේ අධ්‍යාපනයට මුදල් යෙදවීමට හැකි වන නිසා රැකියාවක් කිරීමට තීරණය කර ඇත. ඔවුන්ගේ දෙමව්පියන් දෛනික කුලී කම්කරුවන් හෝ රැකියා සොයා විදේශගත වූවන් වේ. ඇතැම් අවස්ථාවල දී, අවුරුදු 17 හෝ අවුරුදු 20 තරම් අඩු වයසේ සිටින දරුවන් ඔවුන්ගේ රැකියාවෙන් උපයා ගන්නා වැටුපෙන් ඔවුන්ගේ මුළු පවුලම නඩත්තු කරති.

බණ්ඩාරවෙල දී අදහස් දැක්වූවන් රැකියා සොයා ගමේ සිට ප්‍රධාන නගරවලට සංක්‍රමණය වූ තම සහෝදර සහෝදරියන් සහ තමන්ට වඩ වැඩිමහල් අනෙකුත් යෞවනයින් පිළිබඳ අත්දැකීම් විස්තර කළහ. ඇඟළුම් කම්හල්වල රැකියා ලබා ගෙන ඇති තරුණියන් මෙන්ම සුපිරි වෙළෙඳසැල්වල සහ රෙදිපිළි වෙළෙඳසැල්වල සේවය කරන තරුණ තරුණියන් ද, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවය කරන තරුණයින් ද බොහෝවිට එලෙස සංක්‍රමණය වූවන්ට අයත් විය.

**අපි අපේ අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන යාමට, නැති නම් තාක්ෂණ හෝ වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට පවා කැමතියි. නමුත් නිවසේ තිබෙන ආර්ථික ප්‍රශ්න නිසා අපි රැකියාවක් කිරීමට තීරණය කළා.**

- මහනුවර -

මෙම තරුණ තරුණියන් නගරයට ගිය පසු තමන් ඔවුන් සමග එතරම් සන්නිවේදනයක් සිදු නොකරන බවත්, එහෙත් ඔවුන් නිවාඩුවක් සඳහා ආපසු නිවසට පැමිණි විට, ඔවුන් යොවුන් සිසුන්ට උපදෙස් දෙමින් අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යන ලෙසටත්, ඔවුන් මෙන් කටයුතු නොකරන ලෙසටත් පවසන බව අදහස් දැක්වූ අය පැවසූහ. තවදුරටත් තම අධ්‍යාපන කටයුතු කරගෙන නොගොස් රැකියාවක් සොයා වත්තෙන් සහ තම දිස්ත්‍රික්කයෙන් පිටව යාමට තමන්ම සිතූ බව අදහස් දැක්වූවන් ගෙන් තුනෙන් එකක් පමණ දෙනා පැවසූහ.

> අපි පොඩි කාලේ හිතුවේ අපි වෛද්‍යවරු, නීතිඥවරු, නැත්නම් පොලිස් නිලධාරීන් වෙන්න ඕනෑ කියලා. නමුත් අපිට ඒවා යථාර්ථයක් බවට පත්කර ගන්න ඕනෑ සහයෝගය ලැබෙන්නෙ නැහැ. අපේ ගෙවල්වල ආර්ථික තත්ත්වය ඉතාම දුෂ්කරයි. අපේ අධ්‍යාපනය ගැන හිතනවාට වඩා අපේ පවුලේ අනෙක් අයගේ, නැත්නම් අපේ රෝගී ඥාතීන්ගේ අවශ්‍යතා ගැන සලකා බැලිය යුතුයි.



## රැකියා අභිලාෂයන්

මලෛයහ දෙමළ තරුණ තරුණියන් ඔවුන්ට සොයාගත හැකි රැකියා 'අනාගතයන්' පුළුල් පරාසයක් පිළිබඳව සඳහන් කළහ. මේවා සෑම තැනකම තිබෙන රජයේ රැකියාවල සිට විදේශ රැකියා සහ පෞද්ගලික අංශය දක්වා විහිදී යයි. බොහෝ දෙනෙකුගේ ඉලක්කය වූයේ හොඳ වැටුපක් ලැබෙන රැකියාවක් ලබා ගැනීම සහ ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට උපකාර කිරීම යි.

රජයේ රැකියා මලෛයහ දෙමළ තරුණ තරුණියන්ගේ ප්‍රධාන අපේක්ෂාවක් වූ අතර, එය දැඩි ලෙස සමාජීය වශයෙන් පිළිගැනීමක් සහිත රැකියා අංශය විය. ළමයින් වයසින් වැඩෙන විට ඔවුන්ගේ දෙමව්පියන් ඔවුන්ට පවසා

ඇත්තේ රජයේ රැකියාවල ඇති රැකියා සුරක්ෂිතභාවය සහ ප්‍රතිලාභ නිසා ඔවුන් රජයේ රැකියාවක් ලබා ගත යුතු බව ය. 'රජයේ රැකියාවක්' ඔවුන්ට දිගුකාලීන ආරක්ෂාවක් සහ විශ්‍රාම ගැනීමෙන් පසු විශ්‍රාම වැටුපක් ලැබීම සහතික කළේය. එය ඔවුන්ගේ ම තේරීමක්ද, නැත හොත් පවුල කෙරෙහි ඇති වගකීමක් ලෙස ඔවුන් භාර ගන්නා දෙයක්ද යන්න සැමවිටම පැහැදිලි නැත.

මස්කෙළිය ප්‍රදේශයේ අදහස් දැක්වූවන් රජය රැකියා ලක්ෂයක් ලබා දෙන විට එයින් කිහිපයක් ඔවුන්ගේ වත්තේ අයට ද ලබා දුන් බව සඳහන් කළහ. එමගින් අන් අය තුළ තමන් ඉගෙන ගැනීමට අවශ්‍ය නැත යන මානසිකත්වය ගොඩනැගී තිබුණි. මෙතරම් පහසුවෙන් රැකියා ලබා දෙන්නේ නම් තමන් ප්‍රසිද්ධ විභාගවලට පෙනී සිටියේ මන්දැයි එම විභාගවලට පෙනී සිටියවුන් සිතූහ.

සිසුන් ගණනාවක් ම යුද හමුදාවේ, විශේෂ කාර්ය බලකායේ හෝ පොලීසියේ රැකියාවක් ලබා ගැනීම 'රජයේ රැකියා' අභිලාෂයේ ම දිගුවක් යැයි සඳහන් කිරීම නැවත නැවත සඳහන් කරන ලද අදහසක් විය. ඔවුන් සන්නද්ධ හමුදාවවල වීඩියෝ දර්ශන හෝ රූපවාහිනී විකාශන දැක ඇති අතර, එයින් නිරූපණය වූ දෙය මගින් ඔවුන් ද එම භූමිකාවන්හි කටයුතු කිරීම සලකා බැලීමට ඔවුන්ව පෙලඹවූයේය. කෙසේ වෙතත්, එම අංශයට සම්බන්ධ වීමට උත්සාහ කිරීමේදී මුහුණ දීමට



සිදු වන, මෙම ප්‍රජාවට ම විශේෂිත වූ බාධාවන් පිළිබඳව බොහෝ දෙනෙක් සඳහන් කළහ. පොලිස් නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම වැනි විශේෂයෙන් දුෂ්කර කාර්යයන් පිළිබඳව මහනුවරදී අදහස් දැක්වූවන් සඳහන් කළහ.

"

**මම ගුරුවරියක් වෙන්න කැමතියි. එවිට මගේ පඩියෙන් සහ විශ්‍රාම වැටුපෙන් මට මගේ මවුපියන්ව ආරක්ෂාකාරීව රැකබලා ගන්න පුළුවන්. මට වතු ප්‍රදේශයේ ම රැකියාව ලැබුණොත් මගේ සමාජයට සහ මගේ ප්‍රජාවට යමක් දිය හැකියි.**

කුඩා කාලයේ සිට ම තමන්ට ගුරුවරියක් වීමට අවශ්‍යව තිබූ බවත්, ඇය එය ඇයගේ දෙමව්පියන්ට ද පවසා තිබූ සිහිනයක් බවත් මහනුවර ප්‍රදේශයේ දී අදහස් දැක්වූ තරුණියක් සඳහන් කළාය. දැන් ඇය විශ්වවිද්‍යාලයට ඇතුල්වීම හරහා එම මාවතේ ගමන් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින අතර, ඇය විභාගවලට හොඳින් පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට අධිෂ්ඨාන කරගෙන සිටියාය. ඇයගේ දෙමව්පියන් ද ඇයව ඒ සඳහා උනන්දු කරවමින් සිටියහ. බණ්ඩාරවෙල ප්‍රදේශයේ දී, ගුරුවරුන් වීමට අපේක්ෂාවෙන් සිටින අය විශේෂයෙන් ම කලා විෂයයන් ඉගැන්වීමට කැමැත්තක් දක්වයි.

ගුරුවරුන් වීමට කැමැත්තෙන් සිටි නමුත් විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට නොහැකි වූ මස්කෙළිය ප්‍රදේශයේ දී අදහස් දැක්වූවන් ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යාපීඨය වැනි විද්‍යාපීඨවලට ඇතුල්වී එම සහතිකය ලබා ගැනීම වැනි විකල්ප අවස්ථා දෙස බලමින් සිටියහ.



ඇතැම් මලෛයහ දෙමළ තරුණ තරුණියන් විදේශ රැකියා ලබා ගැනීම කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කර සිටියහ. මැදපෙරදිග රටක වසර කිහිපයක් සේවය කර, හොඳින් මුදල් උපයාගෙන ආපසු පැමිණ තම පවුල් වලට උපකාර කිරීම ඔවුන්ගේ අපේක්ෂාව විය. මලෛයහ දෙමළ තරුණ තරුණියන් විකල්පයක් ලෙස විදේශ රැකියා සඳහා යාම බොහෝ විට ඔවුන්ගේ දෙමව්පියන්ගේ අත්දැකීම් අනුව ඔවුන්ට යෝග්‍ය දෙයක් ලෙස සලකන ලදී. එය වැදගත් ආදායම් මාර්ගයක් විය හැකි බව බොහෝ දෙනා දැන සිටිති.

මහනුවර දී අදහස් දැක්වූ, තම දෙමව්පියන් මැදපෙරදිග සේවය කරන තරුණ තරුණියන් තමන්ගේ මව්පියන් එම රටවල කරන රැකියාව කෙබඳුදැයි තමන් සම්පූර්ණයෙන් ම දැන නොසිටින නමුත් එයින් තම පවුලට ප්‍රමාණවත් මුදලක් ලැබෙන බව තමන් දන්නේ යැයි පැවසූහ. එම නිසා පවුලේ ආදායමට දායක වීම පිණිස ගල්ෆ් රටවල සේවය කරන තම පියා සමග එක්වීමට තමන් ද කැමති බව අදහස් දැක්වූ එක් අයෙක් පැවසූහ.

තමන්ගේ දෙමව්පියන්ගෙන් බොහෝ දෙනෙක් මෙයට පෙර වතුවල සේවය කර ඇති නමුත් පසුව ඔවුන් බොහෝ දෙනෙක් විදේශ රටවල රැකියා අපේක්ෂා කළ බව බණ්ඩාරවෙල ප්‍රදේශයේදී අදහස් දැක්වූවන් පැවසූහ. ඔවුන්ගේ මව්වරුන් කිහිප දෙනෙක් ගල්ෆ් රටවල සහ මැද පෙරදිග රටවල ගෘහ සේවිකාවන් ලෙස සහ පවුල්වල රැකවරණය සලසන්නන් ලෙස රැකියා වලට ගොස් ඇත.



තම මව එලෙස එක් වරක් විදේශගත වී සේවය කර ආපසු පැමිණ නැවත එම රටට යාමට සැලසුම් කරමින් සිටි නමුත්, ඇය පිටත්ව යාමට පෙර බලධාරීන් ඇයට සිදුකරවූ වෛද්‍ය පරීක්ෂණයේ දී ඇයට ලබා දුන් එන්නතක් නිසා ඇය අංශභාග තත්ත්වයට පත්වූ බව එක් තරුණයෙක් පැවසුවේය. පවුලට ස්ථාවර ආදායමක් ලැබෙන බව සහතික කිරීම සඳහා ඇයගේ සහෝදරයා එම රැකියාවට ගියේය.



කෙසේ වෙතත්, විදේශ රැකියා ලබා ගැනීම සම්බන්ධ අවදානම් ද ඇති විය හැක. අවසානයේ එමගින් පවුල් මත එහි බර පැටවීම සිදුවිය හැක. බොහෝවිට, පැහැදිලිව ම තම දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා උපකාර කිරීම පිණිස විදේශගත වන දෙමව්පියන්ගේ දරුවන් ඇතැම් විට පෙරටත් වඩා අඩුවෙන් පාසල් යාම සහ පාසලෙන් ගිලිහීම පවා සිදුවීමට ඉඩ තිබේ.

දැරණියගල ප්‍රදේශයේ දී එක් පුද්ගලයෙක් තමන් විදේශගතවීමේ ක්‍රියාවලියට උපකාර ලබා ගැනීම සඳහා සම්බන්ධ කරගත් 'විදේශ රැකියා නියෝජිතායනයක්' විසින් සිදුකරන ලද වංචාවකට ගොදුරු වූ බව විස්තර කළේ ය. ඔහු සැකසුම් කිරීමේ ගාස්තුවක් ලෙස රු. 75,000 ක් ගෙවා තිබූ අතර, ගුවන්ගත වීමට නියමිත යැයි පැවසූ දිනයේ ඔහු එම කාර්යාලය තිබූ ස්ථානයට ගිය විට එම ස්ථානයේ කාර්යාලයක් නොතිබූ බව සොයා ගත්තේය.

තවත් සමහර මලෙයහ දෙමළ තරුණ තරුණියන් පෞද්ගලික අංශයේ වෙනත් රැකියා සඳහා කැමැත්ත පළ කළහ. බණ්ඩාරවෙල ප්‍රදේශයේ දී අදහස් දැක්වූවන් කළමනාකරණ මට්ටමේ රැකියාවලට යාමට අපේක්ෂා කරන බව පැවසූ අතර, සේවාලාභීන්ට වීසා අයදුම්පත් සහ ගුවන් ප්‍රවේශපත් සපයා දීම වැනි සේවාවන් සපයමින් තමන්ගේ ම සංචාරක සමාගමක් ආරම්භ කිරීමට තමන් කැමති බව තවත් සිසුවෙක් පැවසුවේය.

මස්කෙළිය ප්‍රදේශයේ ද කිහිප දෙනෙක් ගිණුම්කරණය ඉගෙන ගනිමින් සිටියේ අවසානයේ බැංකු ක්ෂේත්‍රයේ රැකියාවට යාමේ අපේක්ෂාවෙනි. මහනුවරදී එක් තරුණියක් මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කිරීමේ තම සිහිනය සැබෑ කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලපයට යාමට අවශ්‍ය බව පැවසුවාය. ඇය යූටියුබ් නාලිකාවල ප්‍රවෘත්ති වීඩියෝ දැක ඇති අතර, මාධ්‍ය වේදිකාවකට සම්බන්ධවී ඇයගේ ගමේ ගැටලු මතුකර පෙන්වීමට ඇයට අවශ්‍ය විය. එම ගැටළු ඉස්මතු කර පෙන්වීම මගින්, අනාගත පරම්පරාව සඳහා යම් වෙනසක් සිදු කිරීමට හැකි වනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය.

බොහෝ තරුණ තරුණියන්ට, ඔවුන්ගේ අපේක්ෂාවන් හැඩගස්වා ගැනීමට ඔවුන්ගේ දෙමව්පියන්ගේ රැකියා තත්වයන් සෘජුව ම බලපෑවේය. සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූවන් තම දෙමව්පියන්ට වතුවලදී අත්විඳීමට සිදුවන වැඩකිරීමේ තත්වයන්හි ඉතිහාසය සහ රටාවන් පිළිබඳව කථා කළහ. බොහෝ දෙනෙක් පැවසූ පරිදි, ඔවුන්ගේ දෙමව්පියන් තවදුරටත් වතුවල රැකියා නොකරන අතර, තමන්ගේ ආච්චි සහ ආතා තම පවුලේ වතු ආශ්‍රිතව වැඩ කළ අවසාන පරම්පරාව වූ බව කිහිප දෙනෙක් සඳහන් කළහ. මේවා මන්දගාමීව, එහෙත් ස්ථාවර ලෙස තේ කර්මාන්තයෙන් ශ්‍රමිකයින් ඉවත්ව යාම පෙන්නුම් කරන ඇතැම් දර්ශක වේ. මෙම ලේඛනගත කිරීම



සිදුකිරීමේ දී සම්මුඛ සාකච්ඡාවට භාජනය වූවන් තේ කර්මාන්තයෙන් ඉවත්ව යන පරම්පරාවක කොටසක් වන අතර, ඔවුන් එම ඉවත්වයාමේ රටාවේ ඉතා සීඝ්‍ර පහත වැටීමක් පෙන්නුම් කරයි.

දැරණියගල දී අදහස් දැක්වූ තරුණ තරුණියන්ගේ මව්පියන් තවමත් වතුවල විවිධ අංශයන්හි සේවය කරති. වගාවන් මාරු කර වතුයායේ රබර් සහ කුරුඳු වගා කිරීමෙන් පසුව වතුයායේ වැඩකරන එක් පුද්ගලයෙකුට ලැබෙන වැඩ ප්‍රමාණය අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට ලැබෙන වැටුප ද අඩු විය. මේ හේතුව නිසා ඔවුන්ගේ දෙමව්පියන් ද දෛනික කුලී වැඩවල නිරත වන අතර, ඔවුන්ගෙන් කිහිප දෙනෙක් රැකියා සඳහා විදේශගත වී ඇත. අලුත් පරම්පරාවල සියලු දෙනා ම වත්තෙන් පිටත රැකියා අවස්ථා සොයා යන නිසා වත්තේ රැකියාවලට සම්බන්ධ වූ අවසාන පරම්පරාව ඔවුන් ය.

දෙමව්පියන් නාගරික ප්‍රදේශවල හෝ විදේශ රැකියා වැනි නිවසින් පිටත රැකියාවක නිරත වන විට එය තරුණ තරුණියන්ට ඍජුව ම බලපායි. පවුලේ වැඩිහිටි සහෝදර සහෝදරියන් බොහෝ විට තම බාල සහෝදර සහෝදරියන්ගේ රැකබලා ගැනීමේ වගකීම භාරගත යුතු ය. ඇතැම්විට ඒ සඳහා ඔවුන්ගේ වයස්ගත ආච්චිලාගේ සහ සීයලාගේ උපකාරය ලැබේ.



# ප්‍රජා ගැටළු

මෙම ප්‍රජාවේ තරුණ තරුණියන්ට මලෛයහ දෙමළ ජාතිකයින් යන අනන්‍යතාවය මත පදනම්ව රාජ්‍යයෙන්, සේවා යෝජකයින්ගෙන් හෝ පුද්ගලයින්ගෙන් තමන්ට සිදුවන වෙනස්කොට සැලකීම් පිළිබඳ විවිධ අවබෝධයන් තිබුණි.



"

**අපි මලෛයහ දෙමළ ප්‍රජාවට අයත් නිසා අපේ හාම්පුත්තු සහ වත්තෙන් පිටත අය අපව වෙනස් ආකාරයකටයි දකින්නේ. අපිට වැඩ කිරීමට දක්ෂතාවයක් හෝ හැකියාවක් නැතැයි යන උපකල්පනයක් තිබේ.**

- දැරණියගල -

තමන් සමග දෛනික වැටුප් ලබන රැකියාවල නිරත වන පිරිස අතර පූර්ණ අධ්‍යාපනයක් ලැබූ අය ද සිටින බව දැරණියගල දී අදහස් දැක්වූවන් සඳහන් කළහ. බොහෝ දෙනෙක් එම තත්වයට පත්ව ඇත්තේ ඔවුන්ට වෙනත් රැකියා අවස්ථා නොමැතිකම සහ ඔවුන්ට රැකියාවක් ලබා දීමට මිනිසුන් තුළ ඇති අකමැත්ත හේතුවෙනි.

ක්‍රියාවාදයට සම්බන්ධවී සිටින තරුණ තරුණියන්ට ඔවුන්ගේ ප්‍රජාව ගැන විශේෂ අදහස් තිබුණි. සමාජ ක්‍රියාකාරකම්වල නියැළී සිටින ඇතැම් අදහස් දැක්වූවන් තම ප්‍රජාව තුළ මිනිසුන් අයුක්තියට එරෙහිව හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හෝ කතා නොකරන බව සඳහන් කළහ. උදාහරණයක් ලෙස, තමන් ජීවත් වන පේළි නිවාසය තමන්ගේ වාසස්ථානය බවත්, එය තමන්ට අයිති නැති බවත් සියලු දෙනා ම තේරුම් ගන්නා නමුත් ඒ පිළිබඳව කුමක් කළ යුතු දැයි කළමනාකාරිත්වයෙන් හෝ පළාත් පාලන ආයතනයෙන් විමසීමට කිසිවෙකු කැමති වූයේ නැත. අනෙකුත් ප්‍රජාවන් ඔවුන්ගේ අයිතිවාසිකම් ඉල්ලා සිටිනු ඇති අවස්ථාවල දී, මලෙයහ දෙමළ ප්‍රජාව එතරම් දුරකට තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී නොසිටින බව ඔවුන්ගේ හැඟීම වුවත්, ඔවුන් එයට හේතු පැහැදිලි කළේ නැත.





# නිගමනය

මලෙයහ දෙමළ ප්‍රජාව පිළිබඳව ලියවී ඇති බොහෝ ලියවිලි සහ වාර්තා මගින් ඔවුන් මුහුණ දෙන ඓතිහාසික හා වර්තමාන අරගල කෙරෙහි අවධානය යොමු කර ඇත. ඔවුන්ව අඛණ්ඩව ම කොන් කිරීමට ලක්කරන මෙම පද්ධතිමය අසාර්ථකත්වයන් පිළිබඳව වාර්තාගත කිරීම අවශ්‍ය වන අතර, එහෙත් කතාව එතැනින් අවසන් නොවේ. දේශපාලන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පමණක් නොව, එදිනෙදා ජීවිතයේ දී මෙන් ම අනාගතය සඳහා කරනු ලබන තේරීම් සම්බන්ධයෙන් ද කැපීපෙනෙන ලෙස දැවැන්ත ප්‍රතිරෝධයක් එල්ල වෙයි.

මලෙයහ දෙමළ ජනයා ඔවුන්ගේ ප්‍රජාව ඇතුළත ම විවිධ කථා සහ යථාර්ථයන් සහිත ප්‍රජාවක් බව මෙම වාර්තාව මගින් ලබාදෙන ප්‍රධානතම අවබෝධය වේ. සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ තරුණ තරුණියන් සියලු දෙනා එකම පද්ධතිමය අසාධාරණයන්ට සහ බාධාවන්ට මුහුණ දුන්නද, ඔවුන් විවිධ ආකාර වලින් තම අනාගතය සඳහා මාර්ග තෝරා ගනිමින් සිටිති.

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ තරුණ තරුණියන් අතරින් ඇතමුන්ට ඉහත පෙන්වා දුන් පරිදි අධ්‍යාපන ක්‍රමයේ පවතින අඩුපාඩුකම් හේතුවෙන් තමන් කැමති විෂයන් හැදෑරීමට නොහැකි වී තිබුණි. එසේ තිබියදීත්, තමන්ගේ රුචිකත්වයන් සහ අභිලාෂයන් අනුව තමන් තෝරාගන්නා මාර්ග යක් අනුගමනය කිරීමට 'හැකි කවර හෝ ආකාරයකින්' උත්සාහ කරන බව ඔවුහු පැවසූහ.

උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාලයකට ප්‍රවේශය ලැබී ඇති බැවින් තම සාර්ථකත්වය දැනටමත් ආරම්භ වී ඇති බව තවත් සමහරෙක් පැවසූහ.

තවත් බොහෝ දෙනෙකුට, වතුකරයෙන් පිටත රැකියා පැහැදිලිව ම වතුකරයේ දී ඔවුන්ට ලබා ගත නොහැකි ඉහළ වැටුප් සහ සමාජ සංචලනය ලබා දෙන බැවින්, ඇතැම්විට වතුවල පිහිටි තම නිවෙස් වලින් දුර බැහැර රැකියා තෝරා ගැනීමට සිදුවීම එයට ඇතුළත් වේ.

සෑම ස්ථානයක දී ම පැවති සම්මුඛ සාකච්ඡාවලදී අදහස් දැක්වූවන් සඳහන් කළ කරුණක් වූයේ ඔවුන් තම දෙමව්පියන් සහ ඔවුන්ට පෙර සිටි පරම්පරාවන් වතුකරයේ සොයා ගැනීමට අරගල කළේ යැයි පැවසූ ගෞරවාන්විත ජීවිතය සොයමින් සිටින බව ය.

මලෙයහ දෙමළ ජනයාගේ කතාවලට සහ අරගලවලට ලැබෙන ප්‍රතිචාර හුදෙක් අනුකම්පාව පමණක් නොවිය යුතුය. එම ප්‍රජාව මෙරටට පැමිණ වසර 200 ක් ගතවී ඇතත්, ඔවුන් තවමත් එසේ කොන් කරනු ලැබීමට මුහුණ දෙන්නේ මන්ද යන ප්‍රශ්නය මතු කළ යුතු ය. ඔවුන්ට අවස්ථා සහ ආරක්ෂාව වෙත ප්‍රවේශය ලබා දීම පිණිස ආර්ථික, සමාජීය සහ දේශපාලන ක්ෂේත්‍ර පුරා පැතිර පවතින පද්ධතිමය අසාධාරණය ආමන්ත්‍රණය කළ යුතුය.

මෙම ප්‍රජාව මෙලෙස කොන්කරනු ලැබීම මෙතරම් කාලයක් පුරා පැවතීමට ඉඩ සලසා දුන්, විවිධ ආකාරයේ බලතල දරන්නන් වගකිවයුත්තන් කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ජනතාවගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම නොසලකා හරිමින් දේශපාලන හා ආර්ථික අවශ්‍යතා මත මෙම තත්වය පවත්වාගෙන ගොස් ඇත. ඔවුන්ගේ පුරවැසිභාවය අස්ථාවර කරමින් ඔවුන්ගේ ඡන්ද අයිතිය අහිමි කළ ශ්‍රී ලංකා රජය මෙන්ම ඉන්දියානු රජය ද; ඔවුන්ට අන් ප්‍රජාවන්ට හා සමාන පහසුකම් ලබා නොදීම සම්බන්ධ වගකීම භාර නොගන්නා, ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා පරිපාලනය ද, ලාභ උදෙසා මෙම ප්‍රජාවගේ ශ්‍රමය සූරකන වාණිජ තේ ක්ෂේත්‍රයේ දැවැන්තයන් ද මෙම තත්වයට වගකිවයුත්තන් වේ.

මෙම තරුණ තරුණියන් සහ සමස්ත මලෙයහ දෙමළ ප්‍රජාව ම සියවස් ගණනාවක් පුරා පැවති අසාධාරණයන් හමුවේ තම අනාගතය නිර්වචනය කරන ආකාරය මෙම තරුණ තරුණියන්ගේ ගමන් මග මගින් පෙන්නුම් කරයි. අපි ඔවුන්ගේ තෝරාගැනීම් සහ ජයග්‍රහණ අගයකරන අතර ම, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිගන්නා සහ ආරක්ෂා කරන පද්ධතිමය වෙනසක් වෙනුවෙන් පෙනී සිටිය යුතු ය.

ඡායාරූප : සෙල්වරාජා රාජසේගර්